## සංක්ෂිප්තය


මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරු වූ නව යොවුන් වියේ පාසල් සිසුන් පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක් සිදුකිරීම මෙම පර්යේෂණය මගින් සිදුවිය. සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුම යොදාගනිමින් මෙම පර්යේෂණය සිදුකළ අතර මෙම පර්යේෂණය අරමුණු 05 ක් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි. එම අරමුණු වන්නේ, මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරු වී ඇති නව යොවුන් වියේ පාසල් සිසුන් හා ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හඳුනා ගැනීම, නව යොවුන් වියේ පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරුවීමට හේතු අනාවරණය කර ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිසුන් මුහුණ දී ඇති ගැටලු හඳුනා ගැනීම, නව යොවුන් වියේ පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීමට ගන්නා ලද පියවර හඳුනා ගැනීම සහ මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරු වී ඇති පාසල් සිසුන්ගේ ගැටලු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම වේ.

මෙම අධ්‍යනය සඳහා දත්ත රැස් කිරීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිඋල්ල අධ්‍යාපන කලාපයේ පාසල් පහක් තෝරා ගන්නා ලදී. ඒ අනුව පාසල් පහ තුළ මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරු වූ ළමුන් 75 දෙනෙකු මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනිණි. මෙම ළමුන් 75 දෙනාට අමතරව එම පාසල්වල ඉගැන්වීම් කටයුතු සිදුකරන ගුරුවරු 20 ක් ද, මෙම ළමුන් 75 දෙනාගෙන් ළමුන් 20 දෙනෙකුගේ දෙමාපියන් 20 ක් ද පර්යේෂණයේ නියැදිය ලෙස යොදාගන්නා ලදි. මූලිකව සිසුන්ගෙන් දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලිය භාවිතා කර තිබේ. සිසුන්ගෙන් අනාවරණය නොවන තොරතුරු ලබා ගැනීම සඳහා ගුරුවරු හා දෙමාපියන් වෙනුවෙන් සම්මුඛ සාකච්ඡා ෂෙඩියුල් දෙකක් භාවිත කොට තිබේ. මෙම උපකරණ දෙක මගින් ලබාගත් දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්තාර සහ ප්‍රතිශත වැනි දත්ත විශ්ලේෂණ උපක්‍රම භාවිත කොට තිබේ. මෙලෙස විශ්ලේෂණය කළ දත්ත ඇසුරින් පහත අනාවරණවලට එළඹීමට හැකිවිය. එම අනාවරණ අතර මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරු වී ඇති මෙම සිසුන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් 10 ශ්‍රේණිය නියෝජනය කිරීම, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ සිසුන් තම ප්‍රථම මත්ද්‍රව්‍ය අත්දැකීම ලෙස තුල් හා මද්‍යසාර භාවිතය, පාසල් සිසුන් මුල් වතාවට මත්ද්‍රව්‍ය භාවිතා කරන වයස අවු. 10 තරම් පහළ වයස් සීමාවක වීම, සමවයස් කණ්ඩායම් මුලින්ම මත්ද්‍රව්‍ය අත්දැකීම මෙම සිසුන්ට ලබා දී තිබීම, සිසුන් බහුතරයක් මත්ද්‍රව්‍ය භාවිතා කරන ප්‍රධානම ස්ථානය බවට පාසල පත්ව තිබීම, යහළුවන් යහළුවන් එකතු වී මත්ද්‍රව්‍ය වියදමට අවශ්‍ය මුදල් සොයා ගැනීම සහ පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරු වීමට ප්‍රධානතම හේතුව සමවයස් කණ්ඩායම් වල බලපෑම බවට පත් වීම වැදගත් වේ.

මත්ද්‍රව්‍ය භාවිතය නිසා පාසල් සිසුන් ප්‍රධාන ගැටලු පහකට මුහුණ දී තිබේ. ඒවා නම් කායික ගැටලු, මානසික ගැටලු, ලිංගික ගැටලු, චර්යාමය ගැටලු සහ සමාජමය ගැටලු වේ. නමුත් මෙම ගැටලු වලින් ළමුන් මුදවා ගැනීම සඳහා දෙමාපියන්ට ඇති අවබෝධය අඩුය. පාසල් සිසුන් මතින් මුදවා ගැනීමේදී පාසල් ගුරුවරුන්ට යම් අවබෝධයක් ඇති බව නිගමනය කිරීමට පුළුවන.

මෙම පර්යේෂණය තුළින් හඳුනාගත් අනාවරණ අනුව පහත යෝජනා ඉදිරිපත් කිරීමට පුළුවන. එම යෝජනා නම්, පවුල සම්බන්ධ යෝජනා, පාසල සම්බන්ධ යෝජනා, රජය සම්බන්ධ යෝජනා, ආගමික ස්ථාන සම්බන්ධ යෝජනා ලෙස ප්‍රධාන කොටස් හතරකට බෙදීමට පුළුවන. පාසල සම්බන්ධ යෝජනා වලදී වැදගත්ම යෝජනාව වන්නේ අධ්‍යාපන ලේකම් නිකුත් කොට තිබෙන ED/01/02/09/03/02 යන චක්‍රලේඛනය පාසල තුළ නිවැරදිව ක්‍රියාත්මක කිරීම වේ. එම චක්‍රලේඛනය තුළින් පාසල් තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ පුළුල් වැඩසටහන් රැසක් පෙන්වා දී ඇත. පවුල සම්බන්ධ යෝජනා වලදී දෙමාපියන්ට තම දරුවන් මතින් මුදවා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය, පුනරුත්ථාපනය සහ පසු රැකවරණය පිළිබඳව ඇති අවබෝධය වැඩි දියුණු කරන වැඩසටහන් හඳුන්වා දිය යුතුය. එසේම පාසල් සිසුවාට මත්ද්‍රව්‍ය අත්දැකීම ලබා දෙන ස්ථානයක් ලෙස නිවස ඉතා වැදගත් වේ. මේ නිසා නිවස තුළ ළමුන්ට මත්ද්‍රව්‍ය අත්දැකීම ලැබෙන අවස්ථා සියල්ල නතර කළ යුතුය. පාසල් සිසුන් මතින් මුදවා ගැනීමේදී රජයට හා ආගමික ස්ථාන වලට සුවිශේෂී තැනක් හිමි වේ. පාසල් සිසුවා අතට මත්ද්‍රව්‍ය පත්වීම වැළැක්වීම සඳහා දැඩි නීතිරීති රජය මඟින් සම්පාදනය කළ යුතුය. ආගමික ස්ථාන වලදී මත්ද්‍රව්‍ය භාවිතයේ වැරදි පැතිකඩ පෙන්වමින් දහම් දැනුම මඟින් මතින් තොර මිනිසෙකු බිහිකළ හැකි අයුරු පෙන්වා දිය යුතුය.